# ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය ශ්‍රී ලංකා සන්දර්භය තුළ නිර්වචනය කිරීම

## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය යනු කුමක්ද?

ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය යනුවෙන් අදහස් වන්නේ, කාන්තාවන්ට, පුරුෂයන්ට, ගැහැණු හා පිරිමි ළමුන්ට එරෙහිව සිදුවන ගැටුම් ආශ්‍රිත හෝ පශ්චාත් ගැටුම් සන්දර්භය තුල දක්නට ලැබෙන ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා රටාවන් වේ. ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය අදාළ යුධ ගැටුමට හෝ දේශපාලනික මර්දනයට සෘජුවම හෝ සෘජු නොවන ආකරයෙන් සම්බන්ධ වේ.

- එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයේ ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය සඳහා වන මග පෙන්වීම් සටහන

## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයන්ගේ වින්දිතයන් කවුරුන්ද?

- කාන්තාවන්, පුරුෂයින්, පිරිමි හා ගැහැණු ළමුන්
- ජන වාර්ගික, ආගමික හෝ දේශපානික සුළුතරයන්ට අයත් වන පිරිස්
- වින්දිතයාගේ පවුලේ සාමාජිකයන්, කුඩා දරුවන්, දෙමපියන් හා සහකරුවන්, ස්ත්‍රී දූෂණයක ප්‍රථිපලයක් ලෙස ඇති වූ ගැබ් ගැනීමකින් ඉපදුණු දරුවන්
- ලිංගික වෘත්තියේ යෙදෙන කාන්තාවන්



## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයට ඇතුලත් වන දෑ

- ස්ත්‍රී දූෂණ
- වින්දිතයන්ට එකිනෙකා සමග ලිංගික සංසර්ගයේ යෙදෙන ලෙසට බල කිරීම
- ලිංගික අවයවයන් විකෘති කිරීම
- ලිංගික වහල්භාවය
- සුවය සලසන කාන්තාවන් ලෙස රඳවාගෙන සිටීම (හමුදා නිලධාරීන් වෙනුවෙන් ලිංගික සේවාවන් සැපයීම සඳහා රඳවා තබාගත් කාන්තාවන් සහ ගැහැණු දරුවන් මෙනමින් හැඳින්වේ).
- බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම
- බලහත්කාරයෙන් ගැබ් ගැන්වීම
- බලහත්කාරයෙන් ගබ්සාවලට ලක් කිරීම
- බලහත්කාරයෙන් වන්ධ්‍යකරණයට ලක් කිරීම
- බලහත්කාරයෙන් නිරුවත්කිරීම/ ඇඳුම් ඉවත් කිරීම
- බලහත්කාරයෙන් විවාහ කරවීම
- අනවශ්‍ය ලෙස අතපත ගෑම
- ලිංගික වශයෙන් අවමානයට ලක් කිරීම
- ලිංගික හිංසන ක්‍රියාවන්ට ලක් කරන බවට පවසමින් තර්ජනය කිරීම
- ලිංගික අල්ලස
- ලිංගික සූරාකෑම
- ලිංගික හිංසනය
- මුරපොලවල්වල සිදුවන හිංසනය

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයන්ගේ අපරාධකරුවන් වන්නේ,

රජයේ සන්නද්ධ කණ්ඩායම්වලට අයත් පුද්ගලයන්

රජයේ නොවන සන්නද්ධ කණ්ඩායම්වලට අනුබද්ධ පුද්ගලයන්

ත්‍රස්තවාදීන්

ගැටුම් සන්දර්භයන්, දේශපාලනික අස්ථාවරතා සහිත පරිසරයන් හා දුර්විපාක හිමි නොවන සන්දර්භයන් තුළ තම බලතල අයුතු ලෙස භාවිත කල හැකි පුද්ගලයන්

## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයන් සිදුවන්නේ කොහේදීද?

නිවෙස්වලදී

ගොවිබිම්වලදී

රැඳවුම් කඳවුරු

හමුදා කඳවුරු

සරණාගතයින් රැඳී සිටින අවතැන් කඳවුරුවලදී

මෙය ගැටුම තීව්‍ර අවස්ථාවේදී, ජනගහනය විස්ථාපනය වන විට මෙන්ම ගැටුමට පසුවද සිදුවේ.

## පශ්චාත් ගැටුම් සන්දර්භයක් යනු කුමක්ද?

"නිල සාම ගිවිසුම් අත්සන් කිරීමෙන් පමණක් ගැටුම අවසන් නොවේ. පශ්චාත් ගැටුම් පරිසරයක් පවතින කාල සීමාව නිර්ණය කිරීම දුෂ්කර වේ".

(Frère and Wilen)

"විවෘත යුධ ගැටුම් අවසන් වී ඇති කාල සීමාව. එවන් පරිසරයක් වසර ගණනාවක් ගත වන තෙක් නොසන්සුන් ව පැවතිය හැකි අතර ඉතා පහසුවෙන් හිංසනයට ඇද වැටිය හැකිය"

(එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය)

"පශ්චාත් ගැටුම් පරිසරය" එක් සිදුවීමක් වටා බැඳුණු කාලයක් නොව සාම සන්ධිස්ථාන පරාසයක් අත්කර ගන්නා කාලයකි.

(Brown, Langer and Stewart)

## සාම සන්ධිස්ථාන

STOP

1. ප්‍රචණ්ඩත්වය හා එදිරිවාදිකම් නතර කිරීම
2. දේශපාලන/ සාම ගිවිසුම් අත්සන් කිරීම
3. සරණාගතයන් නැවත මව් රට බලා යැවීම
4. ක්‍රියාකාරී රාජ්‍යක් පිහිටුවීම
5. සංහිඳියාව සහ සමාජ අනුකලනය ලඟා කර ගැනීම
6. ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම
7. ප්‍රතිසන්ධානය හා සමාජ ඒකාබද්ධතාවය අත්කර ගැනීම

## ලිංගික හිංසනය ගැටුම් හා සම්බන්ධ වන්නේ කිනම් අවස්ථා වලදීද?

### එය යුධ උපක්‍රමයක් ලෙස භාවිත කෙරෙන විට

ලිංගික හිංසනය උපායශීලි ලෙස දේශපාලනික හෝ හමුදා ඉලක්ක සපුරා ගැනීමේ අදහසින් හෝ එම ඉලක්ක ඉටු කර ගැනීම සඳහා භාවිත කෙරෙන විට.

### තත්කාලීන බව

අයිතීන් උල්ලංඝණය වීම, එම උල්ලංඝනය සිදුවන කාල සීමාව හේතුවෙන් ගැටුම හා සම්බන්ධ වීම. කාලය පදනම්ව ගැටුම හා උල්ලංඝණය අතර ඇති වන සම්බන්ධය.

### ස්ථානය

යම් ලිංගික හිංසනයක් ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයක් ලෙස හැඳින්වීමට එය ගැටුම පවතින භූගෝලීය ප්‍රදේශයේ සිදු විය යුතු වේ.

ලිංගික හිංසනය ගැටුම් හා සම්බන්ධ වන්නේ:

- එය ගැටුමක් බවට පරිවර්තනය වීමේ ප්‍රවණතාවයක් ඇති අස්ථාවර පරිසරයකදී සිදු වන විට
- අත්පත් කර ගැනීමක් සිදු වී ඇති අවස්ථාවකදී
- ගැටුමට සම්බන්ධ ජනතාවගේ නිදහස අහිමි වී ඇති අවස්ථාවකදී
- ගැටුමක් අවසන් වී නැවත ආණ්ඩුවක් පිහිටුවීමට පෙර අවස්ථාවකදී
- යුධ ගැටුමක් හේතුවෙන් අවතැන් වූ සරණාගත ජනතාවට අයත් කෙනෙකුට සිදු වූ විට

## පශ්චාත් ගැටුම් සන්දර්භයන් තුල ඇතිවන ලිංගික හිංසනයන්

පූර්ව ගැටුම් පරිසරයන්ට ගොදුරු වූ පුද්ගලයින් නැවත තම ගම රට බලා පැමිණි විට පළිගැනීමක් ලෙස ලිංගික හිංසනයට ගොදුරුවිය හැකිය.

මෙවන් පුද්ගලයින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට, ලිංගික සූරාකෑමට හා පුද්ගල ජාවාරමට ලක් විය හැකිය.

ජීන් වෝඩ් සහ එක්සත් ජාතීන්ගේ කාන්තාවන් (Jeanne Ward and UN Women), ගැටුම් වලදී කාන්තාවන්ට එරෙහි හිංසනය, පශ්චාත් ගැටුම් සහ හදිසි සැකසුම් (2013)

**ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය නිසාවෙන් සැලකිය යුතු ප්‍රතිවිපාක ඇති වන අතර ඒ වෙනුවෙන් පරිණාමය වන නිර්වචනයක් අවශ්‍ය වේ.**

## ලිංගික හිංසනය හා ගැටුම් අතර ඇති සම්බන්ධතාවය

අපරාධකරුගේ තොරතුරු සලකා බැලූ විට සම්බන්ධතාවය පැහැදිලි වේ. (රජයේ සන්නද්ධ හමුදා හෝ ත්‍රස්තවාදී ජාලයක්/ කණ්ඩායමක් ඇතුලත්ව රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම්).

බලය අයුතු ලෙස භාවිතා කිරීම (ආණ්ඩුව බිඳවැටීම හා සම්බන්ධ වේ).

වින්දිතයාගේ තොරතුරු (බොහෝදුරට පීඩවට පත්වූ දේශපාලනික, ජනවාර්ගික හෝ ආගමික සුළුතරයකට අයත් වේ).

දේශ සීමා ගැටළු හේතුවෙන් ඇති වන ප්‍රතිවිපාක. (අවතැන් වීම්, පුද්ගල ජාවාරම) හෝ සටන් විරාම ගිවිසුම් උල්ලංඝණය කිරීම.

සැබෑ හෝ සිතාගනු ලැබූ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුනු අනන්‍යතාවය මත පදනම්ව ඉලක්ක ගත වේ.

ගැටුම් පරිසරයක් තුළ ලිංගික හිංසනය හෝ සූරාකෑම සඳහා පුද්ගලයන් ජාවාරම් කිරීම. ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ මහලේකම් වාර්තාව (2017).

## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය සරණාගත හෝ අවතැන් වූ පුද්ගලයින්ට එරෙහිව සිදු වන විට,

යුධ ගැටුම් නිසා සරණාගතයන් බවට පත්වීමට සිදු වූ අවතැන් වූ පුද්ගලයන් ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයට ලක්වීමට ඇති ප්‍රවණතාවය ඉහල වන්නේ ඔවුන් හට නුහුරු නුපුරුදු පරිසරයක් තුළ ජීවත්වීමට සිදු වීම හේතුවෙනි.



අවතැන් වූ පුද්ගලයින් හෝ සරණාගතයින්, සටන්කරුවන් හා බලධාරීන්ගේ වෙනස්කොට සැලකීම් හේතුවෙන් ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයන්ට ලක්විය හැකිය. සමහර පුද්ගලයන් ඔවුන්ගේ ජාතිය, ජනවර්ගය හෝ ආගම හේතුවෙන් ගොදුරුවීමට ලක්විය හැකිය.

## ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුත්තේ ඇයි?

අධිකරණ පද්ධතියේ ඇති අකාර්යක්ෂමතා හේතුවෙන් නිසි ලෙස නඩු නොපැවරීම, වරදකරුවන්ට දඬුවම් නොලැබීම මෙන්ම වින්දිතයන්ට ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයන් වාර්තා කිරීමට හැකියාවක් නොමැති වීම.

නොහැකියාව, ආරක්ෂිත නොවීම හා සංස්කෘතිකමය හේතු විසින් වින්දිතයන් මෙයාකාරයේ ලිංගික හිංසනයන් වාර්තා කිරීම වලක්වයි.

ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනය බලය අයුතු ලෙස භාවිත කිරීම හා බැඳී පවතී.


/Centre-for-Equality-and-Justice /CEJ_SriLanka /cej_srilanka /channel/CEJ Sri Lanka

www.cejsrilanka.org | srilanka.cej@gmail.com



Centre for Equality and Justice

GLOBAL FUND FOR WOMEN Champions for Equality